# ගෙවතු වගා වැඩසටහන

දෙපාර්තමේන්තුවේ සියලුම ආයතන/ඒකක ප්‍රධානීන්
ඇතුළු සියළුම කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකාවේ දනට පවත්නා අර්බුදකාරී වාතාවරණය තුළ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමේ අරමුණින් පවත්වන සෑම ඉඩකඩකම වගා කිරීමට රජය සැලසුම් කර ඇත. ඒ සඳහා වන මහ පෙන්වීම පිණිස ගරු අග්‍රාමාත්‍ය සහ වැඩ බලන ජනාධිපති තුමා විසින් ආහාර සුරක්ෂිතතා කමිටුවක් පිහිටුවා ඇති අතර ඒ සඳහා කොළඹ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂතුමිය සහභාගී වෙයි.

ඊට අමතරව COPA කමිටුවේදී උපදෙස් ලබා දී අති පරිදි අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ආහාර සුරක්ෂිතතා අනුකමිටුවේ සාමාජිකත්වයට නම් කර ඇත.

මෙම සියළු කමිටු වලින් බලාපොරොත්තු වන්නේ රට තුළ පවත්නා රාජ්‍ය ආයතන සම්බන්ධ කරගෙන පුළුල් ආහාර සුරක්ෂිතතා වැඩසටහනක් ක්‍රියාත්මකකිරීමයි. එහිදී අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියලු ආයතන පහත උපදෙස් වලට අනුව ක්‍රියාකරන මෙන් කාරුණිකව දන්වමි.

I. දෙපාර්තමේන්තුවේ ආයතන පරිශ්‍රවල වගා කිරීම.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හැරුණු විට පර්යේෂණ අංශයේ ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථාන 07ක්, සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂ කාර්යාල 17ක් සහ පැළ තවාන් 08ක් ඇත. මේවායින් කොළඹ දිස්ත්‍රික් කාර්යාලය හැර අනෙකුත් කාර්යාල වල යම් භූමි ප්‍රමාණයක් පවතින අතර සමහර පරිශ්‍ර වල ඉතා සීමිත ඉඩකඩක් සහ අනෙකුත් පරිශ්‍රවල සැලකිය යුතු ඉඩක්ද පවතී. මේ අනුව පහත ආකාරයට ක්‍රියාකරන මෙන් දන්වමි.

- සියලු ආයතන පරිශ්‍රවල පවත්නා ඉඩ ප්‍රමාණ අනුව පෝච්චිවල හෝ කුඩා පාත්ති හෝ පවත්නා ඉඩකඩ තුළ හැකි පමණින් එළවළු, මුං, කව්පි වැනි රනිල බෝග, අල බෝග හෝ වෙනත් වගාකළහැකි බෝග වර්ග වගා කළ යුතුය.
- නිල නිවාසවල ජීවත් වන නිලධාරීන්ට නිල නිවාස අවට හැකිතාක් දුරට වගා කළ යුතුය.
- එමෙන්ම කාර්යාල පරිශ්‍රයන් තුළ ඉඩකඩ පවතී නම් නිලධාරී කණ්ඩායම් වලට ඉඩම් කොටස් වෙන්කර දී උක්ත බෝග වගා කිරීමටත් ලැබෙන අස්වැන්න සුභසාධක සංගම් හරහා අළෙවි කිරීමටත් එම මුදලින් 10% ක් සුභසාධක සංගම් ගාස්තු ලෙස අයකර ඉතිරිය රාජ්‍ය අරමුදලට බැර කිරීමටත් හැකියාව ඇත. මේ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හැකිතාක් අවට පරිසරයෙන් සොයා ගැනීමටත්, අනෙක්වා සුළුඅක් මුදලින් හෝ විශේෂ අනුමැතිය (2:14:1) යටතේ මිළදී ගැනීමත් කළ හැක.
- එසේම ආයතන තුළ තනිතනිව වගාවන් සිදු කිරීමට කැමැත්ත දක්වන නිලධාරීන් සිටීනම් ඔවුන්ගේ අයඳුම්පතක් ලබාගෙන සිය පවුලේ අවශ්‍යතා සඳහා බෝග පාත්ති කීපයක් තම වියදමින් වගා කර ගැනීමට අවස්ථාව සලසා දිය හැක. ලැබෙන අස්වැන්නෙන් 5% ක් සුභසාධක සංගමයට ලබා දී ඉතිරිය තමන්ට ලබා ගැනීමටද හැක. මෙහිදී සියලු අමුද්‍රව්‍ය අදාළ නිලධාරීන්ගේ වියදමින් යෙදවිය යුතු අතර අවශ්‍ය ජලය පමණක් ආයතන පරිශ්‍රයෙන් ලබා ගත හැකිය.
- දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම් ඉතා සීමිත බැවින් අවශ්‍යතා සඳහා ඉතා සීමිතව මුදල් වැය කරන ලෙසට උපදෙස් ලබා දෙමි.

II. ආයතනවල නිලධාරීන් ගෙවතු වගාව සඳහා යොමු කිරීම.

ගෙවතු වගාවන් සිදු කිරීමේ වැදගත්කම පිළිබඳව සියලු නිලධාරීන්ට පොදු දේශන පැවැත්විය යුතු අතර සියලු ආයතන හා ඒකක ප්‍රධානීන් තම ආයතන වල නිලධාරීන් ඒ සඳහා යොමු කරවීමට නිරන්තරයෙන් ක්‍රියා කළ යුතුය.

- රෝපණ ද්‍රව්‍ය හුවමාරු වැඩසටහන් පැවැත්වීම. (එක් එක් නිලධාරීන්ගේ ගෙවත්තෙන් සොයාගත හැකි රෝපපණ ද්‍රව්‍ය එක් දිනකදී කාර්යාලයට රැගෙනවිත් හුවමාරු කර ගැනීම)
- WhatsApp අන්තර්ජාල යෙදවුම හරහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුලත් කරමින් සමූහයක් සකස් කර ගෙවතු වගාව සිදුකරන ක්‍රමවේදය, ඇතිවන ගැටළුවලට උපදෙස් ආදිය පිළිබඳ නිරන්තරයෙන් දැනුම බෙදා ගැනීමේ වැඩසටහනක් දැනටමත් ක්‍රියාත්මක වේ. ඒ සඳහා ඒ සඳහා සහභාගී වන ලෙස තම ආයතන වල නිලධාරීන් දැනුවත් කළ යුතුය.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් ආයතනවල නිලධාරීන් කැඳවාගෙන ආහාර බෝග වගාව පිළිබඳ වරින්වර දේශන සිදු කිරීම මඟින් අවශ්‍ය දැනුම ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ.
- බීජ, රෝපණ ද්‍රව්‍ය, වගා බඳුන් ආදිය මිළදී ගැනීමට අවශ්‍ය නම් එම සැපයුම්කරුවන් හඳුනාගෙන ආයතනයේ අවශ්‍යතාවයන් තොග වශයෙන් මිළදී ගැනීමට හැකි නම් එය සුදුසු වේ.
- මීට අමතරව ආයතන තුළ හැකිතාක් කොම්පෝස්ට් පෙපහොර ආදිය නිශ්පාදනය කොට භාවිතයට ගැනීම මඟින් වැඩි අස්වැන්නක් සහ ගුණාත්මක අස්වැන්නක් ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය.

III. ක්ෂේත්‍ර නිලධාරීන් විසින් නිරීක්ෂණය කරන ඉඩම්වල හිමිකරුවන් දැනුවත් කිරීම.

ක්ෂේත්‍ර නිලධාරීන් තමන් නිරීක්ෂණය කරන ඉඩම්වල වගාවන් හිමිකරුවන්ට ගෙවතු වගාවේ වැදගත්කම හා අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් කරන ලෙස උපදෙස් ලබා දෙන අතර ඒ සඳහා හැකිතාක් තාක්ෂණික උපපදෙස් ලබා දිය යුතු වේ. එසේ හැකිනම් එම උපදෙස් ලබා ගත හැකි ස්ථාන පිළිබඳව මහජනතාව දැනුවත් කළ යුතුය.

මෙම දුෂ්කර කාල පරිච්ඡේදය තුළ පැමිණෙන නිලධාරීන් සංඛ්‍යාව, සීමිත සංඛ්‍යාවක් සහ නිලධාරීන්ගේ අවශ්‍යතාවයන් උපයෝගී කරගෙන හැකිතාක් උක්ත වැඩසටහන සාර්ථක කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසන මෙන් කාරුණිකකව දන්වමි.

ඒ.පී.පී. දිස්නා
අධ්‍යක්ෂ ජනරාල්
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095 සිරිමාවෝ බණ්ඩාරනායක මාවත
පේරාදෙණිය

ඒ.පී.පී. දිස්නා
අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

2022.07. 19